# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2205/9 - 2020 දෙසැම්බර් මස 09 වැනි බදාදා - 2020.12.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත**

6 වන වගන්තිය යටතේ වන නියමය

එල්. ඩී. බී. 6/2017.

2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 6 වන වගන්තිය මඟින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින් සිවිල් ගුවන් සේවා අධිකාරිය විමසා, මෙම නියමය මඟින්, I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති නියම සහ කොන්දේසිවලට යටත්ව, II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගගන යාත්‍රාංගනයන් හි දී ගගන නාවික සේවා සැපයීම සඳහා සේවා සපයන්නා වශයෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මෙහි සඳහන් දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරමි.

ප්‍රසන්න රණතුංග,
සංචාරක අමාත්‍ය.

2020 දෙසැම්බර් මස 07 වැනි දින,
කොළඹ දී ය.

I වන උපලේඛනය

***පත් කිරීමේ නියම සහ කොන්දේසි***

1. II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගගන යාත්‍රාංගනයන් හි දී සේවා සැපයීමේ දී, (මෙහි මින් මතු "සේවා සපයන්නා" යනුවෙන් හඳුන්වනු ලබන) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ අදාළ විධිවිධානවලට සහ ඒ යටතේ පනවන ලද නියෝග, රීති හෝ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතු ය;

2. අවස්ථාවෝචිත පරිදි, අධිකාරිය විසින් හෝ ව්‍යවස්ථාදායී සේවා සැපයුම්කරු විසින් ඉන්ධන සහ ලිහිසි තෙල් සැපයීම උදෙසා සේවා සපයන්නා වෙත බද්දට දෙනු ලැබිය හැකි චංචල සහ නිශ්චල දේපළ සියල්ල සේවා සපයන්නා විසින් හොඳ තත්ත්වයෙන් නඩත්තු කළ යුතු අතර, එවැනි දේපළ කිසිදු තුන්වන පාර්ශ්වයකට අතුරු බදු නොදිය යුතු ය;

3. අදාළ අන්තර්ජාතික සහ නිර්දේශිත පරිචයන්ට අනුකූලව සේවා සපයන බවට සහතික වීම සඳහා, II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගගන යාත්‍රාංගනයන් හි දී ඉන්ධන සහ ලිහිසි තෙල් සැපයීම සඳහා නියම කරනු ලබන ශක්‍යතා සහතික සහ බලපත්‍ර, සේවා සපයන්නා විසින් අධිකාරියෙන් ලබා ගත යුතු ය;

4. මේ නියමය යටතේ ඉන්ධන සහ ලිහිසි තෙල් සැපයීම සම්බන්ධයෙන් II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගගන යාත්‍රාංගන තුළට සහ ඒවායින් පිටතට ක්‍රියාත්මක වන ගුවන් සේවාවන් සමග සේවා සපයන්නාට ගිවිසුමකට එළඹිය හැකි අතර, එවැනි ගිවිසුමක් සම්බන්ධයෙන් කිසිඳු ආකාරයක බැඳීමක් රාජ්‍ය මත ඇති නොකරනු ලැබිය යුතු ය;

5. අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ලිඛිතව නියම කළ අවස්ථාවක, මේ නියමය යටතේ සේවා සපයන්නා විසින් සේවා සැපයීමට අදාළ යම් පරිපාලනමය, මෙහෙයුම්, තාක්ෂණික හෝ මූල්‍යමය කාරණා පිළිබඳව අදාළ සියලු දත්ත, සංඛ්‍යාලේඛන සහ තොරතුරු සේවා සපයන්නා විසින් ලේකම්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය;

6. II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගගන යාත්‍රාංගන තුළට සහ පිටතට ක්‍රියාත්මක වන්නා වූ යම් ගුවන් යානයකට එම ගගන යාත්‍රාංගන ක්‍රියාත්මක වන බවට පළකරන ලද හෝරාවන් හි දී සේවා සපයන්නා විසින් මේ නියමයෙන් බලය ලබා දී ඇති සේවා කාර්යක්ෂමව සපයනු ලැබිය යුතු අතර, අමාත්‍යවරයාගේ ලිඛිත අනුමතිය ලබාගැනීමෙන් තොරව, එම සේවා සැපයීම වෙනස් කිරීම, ප්‍රමාද කිරීම, අත්හිටුවීම හෝ නැවැත්වීම සිදු නොකරනු ලැබිය යුතු ය;

7. සේවා සපයන්නා විසින් වෙළඳපොළ ඉල්ලුම නිරන්තරයෙන් සමාලෝචනය කළ යුතු අතර, නියමයෙන් බලය ලබාදී ඇති සේවා සැපයීම වර්ධනය කිරීම, ව්‍යාප්ත කිරීම හෝ වැඩි දියුණු කිරීම කළ යුතු අතර, අවශ්‍ය අවස්ථාවක, සේවා සපයන්නාගේ යටිතල පහසුකම්, තාක්ෂණය හෝ මෙහෙයුම් කාර්ය පටිපාටීන් II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගගන යාත්‍රාංගනවල දියුණුව සඳහා බාධකයක් නොවන බවට තහවුරු කරනු ලැබිය යුතු ය;

8. II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගගන යාත්‍රාංගනයන් හි දී සේවා සැපයීම සඳහා සේවා සපයන්නා විසින් ගුවන් සේවාවන්ගෙන් අයකර ගත යුතු ගාස්තු, කලාපයේ ඉන්ධන මිළ ගණන් සමග සැසඳූ විට තරගකාරී විය යුතු අතර, එම ගාස්තු අමාත්‍යාංශ ලේකම්වරයා විසින් අනුමත කරනු ලැබිය යුතු ය;

9. සිය මෙහෙයුම් අතරතුර උද්ගත විය හැකි සත්‍ය සහ විභව වගකීම් හෝ වන්දි ගෙවීම් ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් වන රක්ෂණ ආවරණයක් සේවා සපයන්නා විසින් සකස් කරගත යුතු අතර, එවැනි වගකීම් හෝ වන්දි ගෙවීම් පිළිබඳව වගකීම රාජ්‍ය මත නොපැවරෙනු ඇත;

10. සංස්ථා අනන්‍යතාවය, කොටස් මූලධනය හෝ සේවා සපයන්නාගේ නම වෙනස් කිරීම සඳහා අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමතය අවශ්‍ය වේ;

11. අමාත්‍යවරයාගේ ලිඛිත අනුමතයෙන් තොරව සේවා සපයන්නා විසින් II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගගන යාත්‍රාංගනයන් හි දී සේවා සැපයීම, මාරු කිරීම හෝ අතුරු බදු දීම හෝ සිදු නොකළ යුතු ය;

12. මේ නියමයේ කාර්යය සඳහා -

"අධිකාරිය" යන්නෙන්, 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත මඟින් පිහිටුවන ලද ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය අදහස් වේ; සහ

"අමාත්‍යවරයා" යන්නෙන්, සිවිල් ගුවන් සේවා විෂයය පවරන ලද අමාත්‍යවරයා අදහස් වේ.

## II වන උපලේඛනය

***සේවා සපයන්නා විසින් සේවා සැපයිය යුතු ගගන යාත්‍රාංගන***

(අ) බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ, කොළඹ;
(ආ) මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ;
(ඇ) කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපළ, රත්මලාන;
(ඈ) මඩකලපුව ජාත්‍යන්තර ගුවන් තොටුපළ; සහ
(ඉ) යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපළ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.